දිවයින 2019 නොවැම්බර් මස 05 වැනිදා අඟහරුවාදා

# මහ බැංකුව 'මෑතකාලීන ආර්ථික ප්‍රවණතා' ප්‍රකාශනය නිකුත් කරයි

ම් නුවන් ගනේවත්ත

**ශ්‍රී ලංකා මහ බැංකුවේ ැතකාලීන ආර්ථික ප්‍රවණතා, 2019 සුවිශේෂ දුවීම් සහ 2020 අපේක්ෂාවන් ප්‍රකාශනය යේ (04 දා) දින විද්‍යුත් මාධ්‍යයෙන් එළිදක්වන ලදී.**

මෙම ප්‍රකාශනය ශ්‍රී ංකා මහ බැංකුවේ වෙබ් ඩවිය හරහා සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන ාෂා තුනෙන්ම බාගත ළ හැකි බව ද මහ ැංකුව කියයි.

'මෑතකාලීන ආර්ථික ප්‍රවණතා' ප්‍රකාශනයෙහි 2019 වසරේ ශ්‍රී ලංකා ආර්ථිකයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ සමස්ත නිරීක්ෂණය අන්තර්ගත වේ.

එහි මෙසේ සඳහන්ය.

2019 වසරේ පළමු භාගයේදී පාස්කු ඉරුදින සිදුවූ ප්‍රහාරවල බලපෑම ද ඇතුළුව මූලික වශයෙන් දේශීයව පැන නැඟුන අභියෝග මධ්‍යයේ ශ්‍රී ලංකා ආර්ථිකය මන්දගාමී වර්ධනයක් වාර්තා කළේය. ඒ අනුව 2019 වසරේ පළමු භාගයේදී ආර්ථිකය සියයට 2.6 ක පහළ වර්ධන වේගයක් වාර්තා කළ අතර 2018 වර්ෂයේ අනුරූප කාලපරිච්ඡේදයේදී ආර්ථික වර්ධන වේගය සියයට 3.9 ක් විය. ආර්ථිකයේ මන්දගාමී වර්ධනයට සමගාමීව 2019 පළමු භාගය තුළදී විරැකියා අනුපාතිකය ද ඉහළ ගියේය.

සැපයුම් අංශයේ මතු වූ තත්ත්ව හේතුවෙන් වරින් වර විචනයන් පැවතිය ද වර්ෂයේ මේ දක්වා කාලය තුළ උද්ධමනය අපේක්ෂිත පරාසය තුළ අඛණ්ඩව පැවතුණි. පාරිභෝගික මිල දර්ශකය තුළ නිවාස කුලී සඳහා යම් කාලසීමාවකට වරක් සිදු කළ ගැලපීම හේතුවෙන් මූලික උද්ධමනය 2019 වසරේ ජනවාරි මාසයේදී වැඩි වුව ද එහි බලපෑම 2020 ජනවාරි මාසය වනවිට පහව යනු ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුව නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය වෙත කඩිනමින් යොමු වෙමින් සිටින අතර උද්ධමනය මැද තනි අගයක මට්ටමේ ස්ථායීව පවත්වා ගැනීමේ අරමුණින් වැඩිදියුණු කළ මුදල් ප්‍රතිපත්ති රාමුවක් යටතේ ඉදිරි දැක්මක් සහිතව මුදල් ප්‍රතිපත්තිය අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. මනාව පාලනය වූ උද්ධමනය සහ උද්ධමන අපේක්ෂා මධ්‍යයේ මන්දගාමී ආර්ථික වර්ධනය, මුදල් හා ණය වර්ධනයේ අඛණ්ඩ පහළ යෑම සහ ගෝලීය වශයෙන් මුදල් ප්‍රතිපත්තිය ලිහිල්වීම සලකා බලමින්, 2019 වසරේදී ශ්‍රී ලංකා මහ බැංකුව ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයක් කරා යොමු විය. කෙසේ වුව ද ඉදිරියේදී සිදු කිරීමට නියමිත වැටුප් ඉහළ දැමීම හේතුවෙන් මුදල් ප්‍රතිපත්තිය සඳහා වන ඉදිරි මාර්ගෝපදේශ පිළිබඳව සැලිකිලිමත් විය යුතුය.